# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2493/26 - 2026 ජුනි මස 17 වැනි බදාදා - 2026.06.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය: තිප්‍රාලේ/1/8/3/114 අත්.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය : 4-3/6/2016/HW/322.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැවි , 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

බේස්ලයින් මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය III අදියර සඳහා ඉඩම් අත්කර ගැනීම. (අමතර අත්කර ගැනීම)

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ (නැගෙනහිර පාමංකඩ, කොළඹ මහ නගර සභා සීමාව තුළ ) කිරුළපන ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මු.පි.කො.10006 හා 2022.05.24 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 1 වශයෙන් පෙන්නුම් කර ඇති හෙක්ටයාර් 0.0056 ක් පමණ වූ ඉඩම් කැබැල්ලේ විස්තර පහත පරිදි වේ.

**01. කැබලි අංක 1**
ඉඩමේ නම: වරිපනම් අංක 12 (කොටසක්) පුරාණ විහාර පාර; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය: ජේ.ඒ.වික්‍රමසිංහ, වරිපනම් අංක 12, බලපොකුණ පුරාණ විහාර පාර; ප්‍රමාණය: හෙක්. 0.0056.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2026 අගෝස්තු මස 10 වැනි දින පෙ. ව. 10.30ට තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2026 ජූලි මස 24 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**සුගත් සිසිර කුමාර,**
ප්‍රාදේශීය ලේකම්,
තිඹිරිගස්යාය.

2026 ජුනි මස 01 වැනි දින,
තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 06 - 0121

1A - G 046971 – 16 (2026/06)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය : එල්ඩී/05/2006/පීසී/349.
මගේ අංකය:DSWA/LND/4/ACQUI/F1/28.

අංක 2441/19 හා 2025.06.18 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 2A පිටුවේ පළ කරන ලද දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අගලබඩ ග්‍රාම නිලධාරි වසමේ අ.ග.පි. 155හි කැ. අංක 46, 47 හා 48 ලෙස සඳහන් ඉඩම් අත්පත් කර ගැනීමට අදාළව පළකරන ලද දැන්වීම අවලංගු කරන අතර, නව වන්දි පරීක්ෂණ දිනය හා වේලාව 2026.12.02 දින පෙ.ව. 10.30ට වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

02. ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් 2026.11.18 දිනට මත්තෙන් ඉහත ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම / පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා එම මුදල ගණන් බැලූ ආකාරය පිළිබඳවත් පිටපත් දෙකකින් මා වෙත ඉදිරිපත් කරන ලෙසත් 2026.12.02 දිනැතිව පැවැත්වීමට නියමිත වන්දි පරීක්ෂණයේ දී මා සම්මුඛ විය යුතු බවත් කාරුණිකව මෙයින් දැනුම් දෙමි.

**කුමුදු සී. ලොකුහේවාගම,**
ප්‍රාදේශීය ලේකම්,
වලස්මුල්ල.

2026 ජුනි මස 10 වැනි දින,
වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 06 - 0208

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.